**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
**පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**තනතුරු ඇබෑර්තු**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පුප්පාඩු පවතින පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **අධ්‍යක්ෂ (මාධ්‍ය) (කොන්ත්‍රාත්) තනතුර - (පුරප්පාඩු - 01)**

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධියක් ලබා තිබීම හෝ

මාධ්‍ය ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 10ක් සක්‍රීය සේවයේ යෙදී සිටිම.

**වෘත්තීය සුදුසුකම්:**

මාධ්‍ය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**පළපුරුද්ද:**

උපාධියක් සහිත නිලධාරින් සඳහා පිළගත් ආයතනයක මාධ්‍ය සම්බන්ධ විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද ලබා තිබීම.

උපාධියක් නොමැති නිලධාරින් සඳහා මාධ්‍ය ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවම සීමාව - අවුරුදු 18
උපරිම සීමාව- අවුරුදු 50

**මාසික දීමනාව**: රු. 30,000/- කි

විශ්‍රාමික රජයේ නිලධාරියකු නැවත සේවයේ යොදවනු ලබන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 සහ අනුෂාංගික චක්‍රලේඛයන්හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.

02. **අධ්‍යක්ෂ (රජයේ චිත්‍රපට) (කොන්ත්‍රාත්) - (පුරප්පාඩු - 01)**

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් සපුරා තිබීම

**වෘත්තීය සුදුසුකම්:**

ක්ෂේත්‍රයට අදාලව පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක හදාරා තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

**පළපුරුද්ද:** චිත්‍රපට අධ්‍යක්ෂණයට අදාල කටයුතු පිළිබඳව පිළිගත් ආයතනයක අවම වශයෙන් එක් වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස:** අවම සීමාව - අවුරුදු 30

උපරිම සීමාව- අවුරුදු 55

**මාසික දීමනාව:** රු. 30,000/- කි

03. **වෙබ් සංවර්ධක (කොන්ත්‍රාත්) - (පුරප්පාඩු - 01)**

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් තොරතුරු තාක්ෂණය/වෙබ් අඩවි නිර්මාණය/මෘදුකාංග ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**වෘත්තීය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වෙබ් නිර්මාණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම.

**පළපුරුද්ද:**

රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාලව වෙබ් නිර්මාණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවම සීමාව - අවුරුදු 21

උපරිම සීමාව- අවුරුදු 50

**මාසික දීමනාව:** රු. 27,000/- කි

04. **වෙබ් සංස්කාරක (කොන්ත්‍රාත්) - (පුරප්පාඩු - 02) (සිංහල/දෙමළ)**

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ විද්‍යාව/<u>ජනමාධ්‍ය/ප්‍රවෘත්තිකරණය/ජනසන්නිවේදනය</u> යන ක්ෂේත්‍රයන්ට අදාළ ඕනෑම විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම

හෝ

මාධ්‍ය ක්ෂේත්‍රයේ ආයතනයක විධායක තනතුරක වසර 10 ක සක්‍රීය සේවයේ යෙදී සිටීම

**වෘත්තීය සුදුසුකම්:**

1. <u>පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය</u> යන විෂය ක්ෂේත්‍රයෙන් උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් ජනමාධ්‍ය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබිය යුතුය

2. <u>ජනමාධ්‍ය ප්‍රවෘත්තිකරණය/ජනසන්නිවේදනය</u> යන විෂය ක්ෂේත්‍රයෙන් උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා සම්පූර්ණ කර තිබිය යුතුය.

**පළපුරුද්ද:**

උපාධියක් සඳහා නිලධාරින් සඳහා පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය <u>මාධ්‍ය ක්ෂේත්‍රයේ</u> අවම වශයෙන් වසර 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

උපාධියක් නොමැති නිලධාරින් සඳහා මාධ්‍ය ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවම සීමාව - අවුරුදු 18

උපරිම සීමාව- අවුරුදු 50

**මාසික දීමනාව:** රු. 25,000/- කි

විශ්‍රාමික රජයේ නිලධාරියකු නැවත සේවයේ යොදවනු ලබන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 සහ අනුෂාංගික චක්‍රලේඛයන්හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.

05. **සංස්කාරක (කොන්ත්‍රාත්) - (පුරප්පාඩු - 02) (සිංහල/ඉංග්‍රීසි)**

**අධ්‍යාපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ උපාධියක් ලබා තිබීම

**වෘත්තීය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ප්‍රකාශන සංස්කරණ හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වසරක නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම

**පළපුරුද්ද:**

රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාලව ලිපි සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවම සීමාව - අවුරුදු 18

උපරිම සීමාව- අවුරුදු 55

**මාසික දීමනාව:** රු. 25,000/- කි

06. **සහාය සංස්කාරක (කොන්ත්‍රාත්) - (පුරප්පාඩු - 05) (සිංහල/ඉංග්‍රීසි/දෙමළ)**

**අධ්‍යපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ උපාධියක් ලබා තිබීම

**වෘත්තීය සුදුසුකම්:**

රජය පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම

**පළපුරුද්ද:**

පිළිගත් ප්‍රකාශන ආයතනයක ලිපි සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**වයස:** අවම සීමාව - අවුරුදු 18

උපරිම සීමාව- අවුරුදු 45

**මාසික දීමනාව**: රු. 21,000/- කි

07. **රූ රටා සංස්කාරක - (කොන්ත්‍රාත්) - (පුරප්පාඩු - 01)**

**අධ්‍යපන සුදුසුකම්:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම

**වෘත්තීය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් රූ රටා සංස්කරණ හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වසරක නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම

**පළපුරුද්ද:**

රජයේ ලියාපදිංචි ප්‍රකාශන ආයතනයක තනතුරට අදාලව රූ රටා සංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවම සීමාව - අවුරුදු 18

උපරිම සීමාව- අවුරුදු 55

**මාසික දීමනාව**: රු. 25,000/- කි

08. **සම්පාදක කාර්ය සහායක (වීඩියෝ නිපැයුම්) - ස්ථිර - (පුරප්පඩු - 01)**

**අධ්‍යාපන සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වරා ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්:**

අදාල තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q) අවම මට්ටමින් දෙවන මට්ටමේ නිපුනතාවක් ලබාගෙන තිබීම.

**පළපුරුද්ද:**

තනතුරට අදාලව පිළිගත් ආයතනයකින් වසර දෙකක(2) පළපුරුද්දක් ලබා තිබිය යුතුය

**වයස:** අවම සීමාව - අවුරුදු 18

උපරිම සීමාව- අවුරුදු 45

වැටුප:

වැටුප් කේත අංකය : PL 02 – 03/2016

වැටුප් පරිමාණය : 25250- 10X270-10X300-10X330-12X350 – 38,450/-

**පොදු කොන්දේසි**

i. සෑම අපේක්ෂයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, මෙම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරක හා මානසික යෝග්‍යාත්වයකින් යුක්ත විය යුතුය.

ii. ඉහත තනතුරු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරන අතර එම සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

iii. අයදුම්කරුවන් සියලුම විස්තර සහිතව තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික සහ පළපුරුද්ද දැක්වෙන සහතිකවල සහතික කළ පිටපත් සමග රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව: නො. 163, කිරුලපන මාවත, කොළඹ 5 යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2016.08.05 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2016 ජුලි මස 05 වැනි දින
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
නො. 163, කිරුලපන මාවත
කොළඹ 5.